**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

අන්තර්මධ්‍ය විභාගය - ජුලි 2014

(56) ව්‍යාපාර නීතිය හා කළමනාකරණය

විෂයයේ

**ව්‍යාපාර නීතිය**

(Business Law)

---

ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 6 ක් දක්වා තිබූ අතර පිළිතුරු බලාපොරොත්තු වී තිබුණේ ඉන් 5 කට පමණි.

## ප්‍රශ්න අංක 01 - ලකුණු 10
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) මෙම කොටසින් 1978 ශ්‍රී ලංකා ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් සෑම තැනැත්තෙකු වෙතම පනවා ඇති මූලික යුතුකම් දෙකක් බලාපොරොත්තු විය. බහුතරයක් අයදුම්කරුවන් මෙම කෙටි ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා තිබුණි. එහෙත් සමහර අයදුම්කරුවන් මූලික යුතුකම් වෙනුවට මූලික අයිතිවාසිකම් ලියූ අවස්ථා තිබුණි.

(b) ශ්‍රී ලංකාවේ උපරිමාධිකරණ දෙක සඳහන් කිරීමට තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු ලිවීමට සමත්වී තිබුණි.

(c) ගිවිසුමක් අවසන් වන ක්‍රම දෙකක් සඳහන් කිරීමට තිබුණි. පිළිතුරු සැපයීමේදී අයදුම්කරුවන්ට ඒ පිළිබඳව පැහැදිලි අවබෝධයක් තිබූ බව පැහැදිලි විය.

(d) මෙම කොටසට පිළිතුරු සැපයීමේදී අයදුම්කරුවන් අර්පනය සඳහා ආරාධනය කිරීම සඳහා උදාහරණ සඳහන් කිරීම වෙනුවට අර්පනය සඳහා ආරාධනය කිරීම පිළිබඳව විස්තර කර තිබුණි. ප්‍රශ්නයට පිළිතුරු දීමට පෙර අසා ඇති දේ ගැන නිවැරදි අවබෝධයක් අයදුම්කරුවන් තුළ තිබිය යුතුය.

(e) බොහෝ අයදුම්කරුවන් මෙම කොටසට නිවැරදි පිළිතුරු සැපයීමට අසමත් වී තිබුණි. එයට හේතුව නම් බොහෝ අයදුම්කරුවන් රැකියාවේ නියැලී සිටින අතරතුර යන්න අමතක කොට අනවශ්‍ය දේ ලියා තිබුණි.

## ප්‍රශ්න අංක 02 - ලකුණු 10
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය ගිවිසුම් නීතිය පදනම් කරගෙන අසා ඇති අතර, එහි (a) කොටසට සාර්ථක පිළිතුරු සපයා තිබුණත් (b) කොටසට සාර්ථක පිළිතුරු සපයා සුළු අයදුම්කරුවන් පිරිසකි. සමහරු කොන්දේසි සහ ප්‍රතිඥාහාර අතර ඇති වෙනස නිවැරදිව පිළිතුරු දීමට ඒ ගැන හරි අවබෝධයක් නොතිබූ බව පෙනී යයි.

## ප්‍රශ්න අංක 03 - ලකුණු 10
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

ගැනුම්කරුවෙක් ගිවිසුමක් කඩ කළ විට මිල නොලත් විකුණුම්කරුවෙකුට, තිබෙන ප්‍රතිකර්ම භාණ්ඩ විකිණීමේ ආඥා පනතට අනුව පැහැදිලි කිරීමට තිබුණි. මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් අවබෝධයෙන් යුතුව නිවැරදි පිළිතුරු සපයා තිබුණි. නමුත් සමහර අයදුම්කරුවන්ට එකම කරුණ දිගින් දිගටම පැහැදිලි කර තිබුණි. සමහරෙක් විකුණුම්කරු වෙනුවට ගැනුම්කරුට තිබෙන ප්‍රතිකර්ම ලියා තිබුණි.

## ප්‍රශ්න අංක 04 - ලකුණු 10

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නයේ (a) කොටසට නියෝජ්‍යත්වය අවසන් වන ක්‍රම සඳහන් කිරීමට තිබුණි. බොහෝ පිරිසක් සාර්ථක නිවැරදි පළිතුරු සපයා තිබුණත් (b) කොටසට සාර්ථක පිළිතුරු සපයා සුළු අයදුම්කරුවන් පිරිසකි. සමහරු අනුමත කිරීම හා වගකීම අතර ඇති වෙනස නිවැරදිව පිළිතුරු දීමට ඒ ගැන හරි අවබෝධයක් නොතිබූ බව පෙනී යයි.

## ප්‍රශ්න අංක 05 - ලකුණු 10

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** චෙක්පත් ලිවීමේදී සිදුවූ වංචාවක් ගැන පිළිබඳව ගැටළුවකි. චෙක්පතක් අත්සන් කිරීමට ප්‍රථම එය නිවැරදිව සම්පූර්ණ කර ඇත්දැයි බැලීම චෙක්පත් හිමිකරුගේ වගකීමක් බව පිළිතුරු වලින් දක්වා තිබුණි. බොහෝ අයදුම්කරුවන් පිළිතුර නිවැරදිව දක්වා තිබුණද සමහරු ඒ පිළිබඳව දැනුවත් වී නැති බව පෙනුණි. සමහරු චෙක්පත අවලංගු කර ගත යුතුයි යන්න දක්වා ඇත. තවත් සමහරෙක් ලිපිකරු සේවයෙන් අයින් කළ යුතු බව දක්වා තිබුණි.

**(b)** "ගනුදෙනු කළ නොහැක" යන වාක්‍ය ඛණ්ඩය භාවිත කිරීමේ නෛතික බලපෑම පිළිබඳව මෙම ප්‍රශ්නයෙන් විමසා තිබුණි. මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුර ලියා තිබුණි.

## ප්‍රශ්න අංක 06 - ලකුණු 10

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

කෙටි සටහන් ලිවීමට තිබූ ප්‍රශ්නයකි.

| | | |
|---|---|---|
| (a) | ස්වේච්ඡාවෙන් බේරුම් කිරීම | : මෙම කොටසට බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු ලියා ලකුණු ලබාගෙන තිබුණි. |
| (b) | කම්කරු විනිශ්චය සභා | : මෙම කොටසට බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු ලියා තිබුණි. |
| (c) | සාමූහික ගිවිසුම් | : මෙම කොටසටද සාර්ථකව පිළිතුරු දී තිබුණි. |
| (d) | ස්වාධීන කොන්ත්‍රාත්කරු | : ස්වාධීන කොන්ත්‍රාත්කරු යන පදය බොහෝ අයදුම්කරුවන් නිවැරදිව තේරුම් ගෙන නොතිබුණි. එම නිසා පිළිතුරට අදාල නොවන නොයෙක් දේ ලියා තිබුණි. අයදුම්කරුවන්ගේ දැනුම මේ සම්බන්ධයෙන් අඩුය. |

\- - -

<u>**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීම සඳහා සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**</u>

1. ප්‍රශ්න පත්‍රය ලබා ගත් වහාම ආරම්භයේ දී ඇති උපදෙස් හොඳින් සැලකිලිමත්ව කියවා තෝරා ගතහැකි ප්‍රශ්න මොනවාද යන්න පිළිබඳව අවබෝධ කර ගත යුතුය.

2. ප්‍රශ්නය කීපවරක් හොඳින් කියවා මැනැවින් අවබෝධ කර ගෙන අසා ඇති කරුණු වලට පමණක් පිළිතුරු සැපයිය යුතුය. අදාල නොවන කරුණු ඇතුලත් නොකළ යුතුය.

3. පිළිතුරු සැපයීමේදී කාලය බෙදාගැනීම පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

4. උත්තර පත්‍ර භාර දීමට පෙර විභාග ශාලාවේදී ප්‍රශ්න අංක හා තමන්ගේ විභාග අංකය නිසිපරිදි යොදා ඇත්දැයි පරීක්ෂා කර බැලීම.

5. අත්අකුරු පැහැදිලිව ලිවීම මගින් පරීක්ෂකවරයාට උත්තර පත්‍රය කියවා හොඳින් අවබෝධ කරගැනීමට සැලැස්වීමෙන් උපරිම ලකුණු ප්‍රමාණය ලබා ගැනීමට හැකිවනු ඇත.

6. විභාගයට පෙර පසුගිය ප්‍රශ්න පත්‍රවලට නිශ්චිත කාලයක් තුළ පිළිතුරු සපයා පෙර පුහුණුවක් ලබාගැනීමෙන් විෂය දැනුම වර්ධනය කර ගැනීමටත්, වේගවත්ව පිළිතුරු සැපයීමේ නිපුණතාව ඇතිකර ගැනීමටත් හැකියාව ලැබේ.

7. දැනුම යාවත්කාලීන කර ගැනීම සඳහා අළුතින් නිකුත් කරන සඟරා, පුවත්පත්, අත්පොත්, පාඨ ග්‍රන්ථ නිරන්තරයෙන් අධ්‍යයනය කළ යුතු වේ.

8. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -